සැ. යු.- 2015.10.16 දින පළ වූ අංක 1,937 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,938 - 2015 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා - 2015.10.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1450 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1451 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 නොවැම්බර් මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ඔක්තෝබර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

### දකුණු පළාත් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2(1) ''අ'' ඡේදයේ අර්ථ නිරූපණය අනුව සහ 1944 අංක 13, 1944 අංක 42, 1945 අංක 12 දරන ආඥා පනත්වලින් හා 1956 අංක 47, 1978 අංක 2 දරන පනත්වලින් සංශෝධිත 1939 අංක 48 දරන ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනතේ 48 වන වගන්තිය යටතේ පැවරී ඇති බලය අනුව දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 14 මඩවලමුල්ල ග්‍රාම නිලධාරී වසමේ අංක මූ. පි. ගා. 43 දරන පිඹුරෙහි, අංක 2 බිම් කැබැල්ලෙහි පිහිටා ඇති බාලිකා ළමා නිවාසය රැඳවුම් නිවාසයක් බවට පත් කර කිතුලම්පිටිය කාන්තා රැඳවුම් නිවාසය ලෙස ප්‍රකාශයට පත් කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

වීරසුමන වීරසිංහ,
ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන,
සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභසාධන,
පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු හා
ගෘහ ආර්ථික ප්‍රවර්ධන, නිවාස හා ඉදිකිරීම්,
මිනිස් බල හා රැකී රක්ෂා අමාත්‍ය,
දකුණු පළාත් සභාව.

2015 සැප්තැම්බර් මස 08 වැනි දින.

10-739/1

---

### දකුණු පළාත් සභාව

දකුණු පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව

**පරිවාස නිලධාරීන් පත් කිරීම**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2(1) ''ආ'' ඡේදයේ අර්ථ නිරූපණය අනුව සහ 1947 අංක 21 දරන ආඥා පනතින් හා 1948 අංක 10 දරන පනතින් සංශෝධිත 1944 අංක 42 දරන වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥා පනතේ 18(3) වගන්තිය යටතේ පැවරී ඇති බලය අනුව පහත I වැනි තීරුවේ නම් සඳහන් පරිවාස නිලධාරීන් දකුණු පළාතේ සියලු අධිකරණ බල ප්‍රදේශ වල රාජකාරී සිදු කිරීම සඳහා II වැනි තීරුවේ සඳහන් දින සිට පත් කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* |
|---|---|---|
| *අනු. අංකය* | *නම* | *දිනය* |
| 01. | සී. ඩී. ජයසිංහ මිය | 1990.01.01 |
| 02. | ප්‍රේමචන්ද්‍ර සුදුසිංහ මයා | 1997.02.17 |
| 03. | කේ. පී. ජී. ධම්මි පුෂ්පමාලි මිය | 1997.02.17 |
| 04. | එන්. පී. කරුණාවතී මිය | 1997.04.30 |
| 05. | එන්. ජී. රම්‍යලතා මිය | 2002.04.01 |
| 06. | රුවන් ශාන්ත ගාල්ලගේ මයා | 2002.04.01 |
| 07. | ජී. එච්. ඒ. ඩී. සජීවනී මිය | 2002.04.01 |
| 08. | බී. එච්. තිස්ස කුමාර මයා | 2002.04.01 |
| 09. | ජී. එන්. මාලනී මිය | 2002.04.01 |

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|---|
| *අනු අංකය* | *නම* | *දිනය* |
| 10. | ඒ. ජී. ඩී. රූපිකා මෙය | 2002.04.01 |
| 11. | ඩී. වී. ඉන්ද්‍රාණි මෙය | 1997.02.17 |
| 12. | පී. එච්. එස්. ප්‍රියන්ජන් මයා | 2002.04.01 |
| 13. | රෝහණ කුමාරනායක මයා | 2002.04.01 |
| 14. | එම්. ජී. සමින්ද පත්මිණි මිය | 2002.04.01 |
| 15. | එස්. කේ. චන්ද්‍රසීලි මිය | 2002.04.01 |
| 16. | ඒ. එල්. ඒ. තිලකරත්න මයා | 2002.04.01 |
| 17. | ජී. ඒ. ජී. ශාන්ත කුමාර මයා | 2002.04.01 |
| 18. | ජගත් ශාන්ත මාවනානෙහේවා මයා | 2005.09.21 |
| 19. | කේ. පී. ලියනාරච්චි මයා | 2005.09.21 |
| 20. | කේ. පී. ටී. එස්. දහනායක මිය | 2005.09.21 |
| 21. | එච්. එල්. ආර්. සුරේෂ් මයා | 2005.09.21 |

මහේෂ් රාජිත කරුණානායක,
සමාජ සුභසාධන, පරිවාස හා
ළමාරක්ෂක සේවා කොමසාරිස්,
දකුණු පළාත් සභාව.

2015 සැප්තැම්බර් මස 02 වැනි දින.

10-739/2

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) II ''ආ'' බණ්ඩයට (III ශ්‍රේණියට)/පුහුණු කිරීමේ ශ්‍රේණියට, සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) II ''ආ'' බණ්ඩය (III ශ්‍රේණිය) සඳහා දීප ව්‍යාප්තව හා කාර්මික නිලධාරි පුහුණු කිරීමේ ශ්‍රේණිය, සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණිය යන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වයඹ පළාත තුළ ස්ථිර පදිංචි, සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *පොදු සුදුසුකම් :*

1.1 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

1.2 වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්නයේ නොකඩවා වසර 03 ක් ස්ථිරවම පදිංචිව සිටි බව සනාථ කළ යුතු ය. (කාර්මික නිලධාරි (සිවිල්) II ''ආ'' තනතුර සඳහා හැර.)

1.3 අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය.

1.4 තෝරා ගනු ලැබීම සඳහා අයදුම්කරුවන් මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු අතර මනා චරිතයකින් යුක්ත විය යුතු ය.

2. *අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණික සුදුසුකම්.-*

| *තනතුරු නාමය* | *තනතුරු සඳහා අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම්* | *එක් එක් තනතුර සඳහා අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම්* | *තාක්ෂණික සුදුසුකම්* |
|---|---|---|---|
| 1. කාර්මික නිලධාරි (සිවිල්) II 'ආ' බණ්ඩය (III ශ්‍රේණිය) | භාෂාව හෝ සාහිත්‍ය ගණිතය, විද්‍යාව සහ තවත් විෂයයකට සම්මාන සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම | ව්‍යවහාරික ගණිතය/ ශුද්ධ ගණිතය/ සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව අ.පො.ස. (උ. පෙළ) විද්‍යා විෂයයන් 03 කින් එකවර සමත්වීම. | (i) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) ලබා තිබීම ; හෝ<br>(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) ලබා තිබීම ; හෝ<br>(iii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) ලබා තිබීම ; හෝ<br>(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) ලබා තිබීම ; හෝ<br>(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන සිවිල් ඉංජිනේරු විභාගයේ I වන කොටස සමත් වී තිබීම ; හෝ<br>(vi) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරනු ලබන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියලු අතින් සමානයැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| 2. කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය. (එක් අවුරුදු) | ඉහත පරිදි වේ. | ඉහත පරිදි වේ. | I. රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ක්ෂේත්‍රයට අදාළ ජාතික තාක්ෂණික සහතිකය (සිවිල්) ලබා තිබීම. (තුන් අවුරුදු අර්ධකාලීන පුහුණු පාඨමාලව) |
| 3. කාර්මික නිලධාරි (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය. (දෑ අවුරුදු) | ඉහත පරිදි වේ. | ඉහත පරිදි වේ. | - |
| 4. සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණිය. (එක් අවුරුදු) | ඉහත පරිදි වේ. | ඉහත පරිදි වේ. | I. රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ අදාළ ජාතික තාක්ෂණ සහතිකය (එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව) සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම. |

*සැ. යු.* - ඉහත සියලු අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් 2015.11.24 දිනට සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතු යි.

2.1 **කාර්මික නිලධාරි/සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් අවුරුදු) :**

ඉහත තනතුරු නාම 1 හි සඳහන් කාර්මික නිලධාරි (සිවිල්) II ''ආ'' ඛණ්ඩය (III ශ්‍රේණිය) ට ප්‍රමාණවත් අයැදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් පමණක් මෙම තනතුර සඳහා බඳවා ගැනීමටත් සැලසුම් ශිල්පීන් ඉහත සුදුසුකම් යටතේ බඳවා ගැනීමටත් කටයුතු කරනු ලැබේ. එසේ බඳවා ගන්නා ලද අයැදුම්කරුවන් සේවයට අදළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිමකොට අදළ විභාගය සමත් වීමෙන් පසු II ''ආ'' ඛණ්ඩය (III ශ්‍රේණිය) ට අදාල වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

2.2 **කාර්මික නිලධාරි පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෑ අවුරුදු) :**

ඉහත සඳහන් කාර්මික නිලධාරි (සිවිල්) II ''ආ'' ඛණ්ඩය (III ශ්‍රේණිය) හා පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් අවුරුදු) සඳහා ප්‍රමාණවත් අයැදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් තනතුරු නාම 3 හි සඳහන් පරිදි සාමාන්‍ය පෙළ හා උසස් පෙළ අධ්‍යාපන සුදුසුකම් මත පමණක් කාර්මික නිලධාරි පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෑ අවුරුදු) සඳහා අයැදුම්කරුවන් බඳවා ගනු ලැබේ. එම අයැදුම්කරුවන් සේවයට අදළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිමකොට අදළ විභාගය සමත් වීමෙන් පසු III ශ්‍රේණියට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

2.3 ඉහත 2.1 හා 2.2 දක්වා ඇති පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන්ගේ සේවය අත්හිටුවනු ලැබේ.

3. *වැටුප් පරිමාණය :-*

3.1 **කාර්මික නිලධාරි (සිවිල්) II ''ආ'' - III ශ්‍රේණිය :**
රු. 15,005 - 180 x 4 - 240 x 6 - 320 x 11- 360 x 20 -රු. 27,885 කි.
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) හි MN3 - 2006A වැටුප් ක්‍රමය)

3.2 **කාර්මික නිලධාරි (සිවිල්)/සැලසුම් ශිල්පි - පුහුණු කිරීමේ ශ්‍රේණිය :**
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (ii) හි 14 වන ඡේදයේ 9 වන විධිවිධාන අනුව පුහුණුවන කාලසීමාව තුළ පහත සඳහන් පරිදි දීමනා ගෙවනු ලැබේ.
පළමු වසර මාසිකව රු. 12,920.00
දෙවන වසර මාසිකව රු. 13,040.00 මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

4. *සේවා කොන්දේසි :*

4.1 තාක්ෂණ සේවයේ II පන්තියේ ''ආ'' ඛණ්ඩයට (III ශ්‍රේණියට) අදළ සුදුසුකම් සහිත අයැදුම්කරුවන් තාක්ෂණ සේවයේ II පන්තියේ ''ආ'' ඛණ්ඩයට (III ශ්‍රේණියට) බඳවා ගනු ලැබේ.

4.2 පුහුණු කිරීමේ ශ්‍රේණියට අදළ සුදුසුකම් සහිත අයැදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

4.3 තාක්ෂණ සේයේ II පන්තියේ ''ආ'' ඛණ්ඩයේ (III ශ්‍රේණියේ) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක මුදල් ගෙවිය යුතු ය.

4.4 මෙම තනතුරට පත් කරනු ලබන්නන් අදළ වන පරිදි අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වනු ඇත.

4.5 දනටමත් වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරියෙකු නම් අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ නියමිත දිනට වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු අතර සේවා කාලය සතුටුදයක විය යුතු ය.

4.6 බඳවා ගන්නා ලද නිලධාරීන් වයඹ පළාත තුළ ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතුය. වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ නියම කරනු ලබන කවර හෝ ප්‍රදේශයක අනිවාර්යයෙන් වසර 05 ක් සේවය කිරීමට බැඳී සිටිය යුතුය. වෙනත් පළාත්වලින් මෙම තනතුරු සඳහා නිලධාරීන් බඳවාගතහොත් ඔවුන් අවුරුදු දහයක කාලයක් අනිවාර්යයෙන් වයඹ පළාතේ සේවය කිරීමේ කොන්දේසියට යටත් විය යුතු ය.

ආයතන සංග්‍රහයේ 1 වන කාණ්ඩයේ II වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වූ ඡේදවල විධිවිධාන තනතුරට ගැළපෙන පරිදි අදාළ වනු ඇත. තව ද මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ/උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද, වයඹ පළාත් මුල්‍ය රීති සංග්‍රහයට හා විනය කාර්යය සංග්‍රහයට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ට ද, රාජ්‍ය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටිය යුතු ය.

5. *බඳවා ගැනීමේ ක්‍රමය :*

5.1 පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇති විට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇති විට වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ. මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන් කුරුණෑගල දී පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

5.2 බඳවා ගැනීමේ ප්‍රතිශතයන් :

(අ) කාර්මික නිලධාරී/ සැලසුම් ශිල්පී

විවෘත තරග විභාගයෙන් 70% හා සීමිත තරග විභාගයෙන් 30%

5.3 විභාග විෂය නිර්දේශයේ දක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුව අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. එම ලේඛනයේ අනුපිළිවෙල අනුව හා පුරප්පාඩු සංඛ්‍යාව මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමක් සිදු නොකෙරේ.

5.4 අදාළ ක්ෂේත්‍රයේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් දෙපාර්තමේන්තු සේවකයින් නොසිටියහොත් මුළු පුරප්පාඩු ප්‍රමාණයම විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත පුරවනු ලබන අතර, එය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අනුව ක්‍රියාත්මක කරනු ලැබේ.

6. *විභාග විෂයය නිර්දේශය :*

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. සවිස්තරාත්මක විභාග විෂය නිර්දේශයන් පහත දක්වා ඇත :-

| *තනතුර* | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| 1. කාර්මික නිලධාරී II ''ආ'' (III ශ්‍රේණිය)<br>2. සැලසුම් ශිල්පී<br>3. කාර්මික නිලධාරී (පුහුණු කිරීමේ ශ්‍රේණිය එක් අවුරුදු) | අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 |
| | තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 |
| 5. කාර්මික නිලධාරී (පුහුණු කිරීමේ ශ්‍රේණිය දෑ අවුරුදු) | අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 |

සැ. යු.- බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන්නේ එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබා ගත හොත් පමණි.

6.1 සවිස්තරාත්මක විෂය නිර්දේශය.-

01. අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01 - ලකුණු 100)

*(අ)* කාර්මික නිලධාරී II ''ආ''/ සැලසුම් ශිල්පී, කාර්මික නිලධාරී පුහුණු කිරීමේ ශ්‍රේණිය එක් අවුරුදු කාර්මික නිලධාරී පුහුණු කිරීමේ ශ්‍රේණිය දෑ අවුරුදු

අයැදුම්කරුවන් භාෂා හැකියාව, ගණිතමය කුසලතාවය, සහ තර්කන ශක්තිය, මැන බැලීම සඳහා සකස් කරනු ලබන කෙටි හා බහුවරණ ශෛලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

02. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය (කාලය පැය 03 කි. ලකුණු 100)

*(අ) කාර්මික නිලධාරි II "ආ" කාර්මික නිලධාරි පුහුණු කිරීමේ ශ්‍රේණිය එක් අවුරුදු*

ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීමේ කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ජල සම්පාදනය හා ජලවහනය, අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිබඳව අපේක්ෂකයා සතු සහජ හැකියාව විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ.

*(ආ) සැලසුම් ශිල්පී*

ගොඩනැගිලි නිර්මාණ ශිල්පිය පිළිබඳ දැනුම,ප්‍රමාණයට අනුව ඇඳීම, සැලැස්මක් හෝ දළ සටහනක් තේරුම් ගැනීමේ හැකියාව, ව්‍යුහගත නිර්මාණයන් පිළිබඳ මූලික දැනුම, සමීක්ෂණ පිළිබඳ දැනුම, ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න ඇතුළත් වනු ඇත. ඉහත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා අවශ්‍ය වන ජ්‍යාමිතික උපකරණ හා සෙසු උපාංග අයැදුම්කරු විසින් විභාග ශාලාවට රැගෙන ආ යුතු ය.

7. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.-*

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය සැපයිය යුතු ය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අයැදුම්කරුවෙකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයැදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

8. *විභාග ගාස්තු.-*

විභාග ගාස්තු වශයෙන් රු. 500 ක මුදලක් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන පරිදි වයඹ පළාතේ පදිංචි අයැදුම්කරු/අයැදුම්කාරිය තමන් ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එම මුදල ගෙවිය යුතුය. වයඹ පළාතේ පදිංචි නොමැති අයැදුම්කරුවන් හට වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන පරිදි මෙම කාර්යාලයට විභාග ගාස්තු ගෙවිය හැකිය. එසේ නොමැති නම් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් නමට මුදල් ඇණවුමක් මගින් ගෙවීම් කළ හැකිය. එසේ මුදල් ගෙවා ලබා ගත් ව. ප. ස. මු. 02 ලදුපත හෝ මුදල් ඇණවුම් අයැදුම්පත්‍රයට අමුණා ඉදිරිපත් කළ හැකිය. (රිසිට් පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය) කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැළකිය යුතු ය.

9. *අයැදුම් කළ යුතු ක්‍රමය.-*

අයැදුම්පත්‍ර ඒ 4 (සෙ. මී. 21 x 29) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්

(i) අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද,
(ii) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ අයැදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු ය.
(iii) දැනටමත් රජයේ සේවයේ නියුතු අයැදුම්කරුවන් අයැදුම්පත්‍රයේ 01 සිට 11 දක්වා සියලුම කොටස් ද අනෙකුත් අයැදුම්කරුවන් අංක 01 සිට 10 දක්වා සියලුම කොටස් ද සම්පූර්ණ කර අයැදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයැදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ද අසම්පූර්ණ ලෙස එවා ඇති ඉල්ලුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් අයැදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක

විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

10. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු අතර එක් එක් විභාගය සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එසේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2015.11.24 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම්පතේ ඇතුළත් තොරතුරුවලට අනුව නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් පහත තොරතුරු සමග වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු ය.

1. අයදුම්පත් හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ පිටපතක් ;
2. ලියාපදිංචි කළ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ;
3. වයඹ පළාතෙන් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍ර එවීමට ෆැක්ස් අංකය.

11. *අනන්‍යතාවය.-*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවයි ඔප්පු කළ යුතුය. මේ සඳහා, (අ) ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ (ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පිළිගැනේ.

12. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමට පසුව තෝරා ගැනීම් කිරීම පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය. නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම්/තීරණ ගැනීමේ අයිතිය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කාන්ති වේහැල්ල,<br>
ලේකම්,<br>
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පළාත් සභා කාර්යාල සංකීර්ණය,<br>
කුරුණෑගල.<br>
දුරකථන අංකය : 037-2233769<br>
2015 ඔක්තෝබර් මස 09 වැනි දින.

***ආදර්ශ අයදුම්පත්‍රය***

*වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015*

ඉල්ලුම් කරනු ලබන තනතුර (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

තනතුරට අදාළ අංකය :

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

සිංහල : දෙමළ : ඉංග්‍රීසි :

01. නම :-

1.1 මුල'කුරු සමග නම Mr./Mrs./Miss :.......................................................................................................<br>
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : RATHNAYAKA R. M. T.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

1.5 ස්ථිර ලිපිනය :..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.6 ස්ථිර ලිපිනය :..........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.7 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :..........................................................................................................

1.8 දුරකථන අංකය :..........................................................................................................

02. 2.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - F ☐ පුරුෂ - M ☐

2.2 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

2.3 2015.11.24 වැනි දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

03. 3.1 අයැදුම්කරු අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය :..........................................................................................................

3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..........................................................................................................

3.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :..........................................................................................................

4. *අධ්‍යාපන සුදුසුකම්.-*

4.1 අ.පො.ස (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර.-

පළමුවර - වර්ෂය හා මාසය :.................................................. විභාග අංකය :..................................................

දෙවනවර - වර්ෂය හා මාසය :.................................................. විභාග අංකය :..................................................

| | *විෂය* | *පළමුවර සාමාර්ථය* | *දෙවනවර සාමාර්ථය* | | *විෂය* | *පළමුවර සාමාර්ථය* | *දෙවනවර සාමාර්ථය* |
|---|---|---|---|---|---|---|---|
| 01 | | | | 06 | | | |
| 02 | | | | 07 | | | |
| 03 | | | | 08 | | | |
| 04 | | | | 09 | | | |
| 05 | | | | 10 | | | |

4.2 අ.පො.ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර.-

විභාගයේ වර්ෂය හා මාසය :..................................................

විභාග අංකය :..................................................

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 03 | | |
| 02 | | | 04 | | |

05. *තාක්ෂණ සුදුසුකම්.-*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාලසීමාව* | *සාමාර්ථය* | *සහතික පත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

06. *වෙනත් සුදුසුකම්* :..................................................
..................................................

07. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුවේ ලකුණු කරන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර.-

i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :..................................................
ii. ලදුපත් අංකය/දිනය හා ගෙවූ මුදල :..................................................

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |

09. *අයැදුම්කරුගේ සහතිකය :*

*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තවද මේ සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි. විභාගයේ සියලුම කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

*(ආ)* මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

..................................................,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :..................................................

10. *අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන................................................ මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිටදී.......................... දින ඔහුගේ/ඇයගේ අත්සන ලැබූ බවද සහතික කරමි.

.................................................

දිනය ඃ................................................. අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම ඃ.................................................

තනතුර ඃ.................................................

ලිපිනය ඃ.................................................

(නිල මුද්‍රාවෙන් සනාථ කරමි.)

11. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ*

ඉහත තොරතුරු සඳහන්....................................................... මයා/මිය/මෙනෙවිය කාර්යාලයේ සේවය කරන ලද බවද ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවද මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇයට දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

.................................................

දිනය ඃ................................................. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම ඃ.................................................

තනතුර ඃ.................................................

ලිපිනය ඃ.................................................

10-900

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.